# ආදරණීය සේකර

ජනවාරි මාසය ඉස්සර නම් හරි සීතලයි. තාමත් ගමට ගියාම ඒ සිතල ගතට වගේම සිතටත් දැනෙනවා. ඒත් ගමට ගියාම දැන් ඉස්සර වගේ නෙවෙයි. ඉස්සර ගමේ තිබුණු සීතල විතරයි තාමත් යන්තමට හරි ඉතිරිවෙලා තියෙන්නෙ. අනිත් හැම දේම වෙනස් වෙලා. මේ අපේ ගමද කියලා ඒ වෙලාවට හිතෙනවා. ඒ එක්කම හිතට නැගෙන්නෙ ඔබව,

ඔබ තමයි ගම වෙනස් වෙලා කියල අපට මුලින්ම කියා දුන්නෙ. ගම විතරක් නෙවෙයි මුළු මහත් ජීවිතයම වටහා ගන්නට ඔබයි අපට කියා දුන්නෙ. මට මතකයි ඔබ ප්‍රබුද්ධ පොතේ මෙහෙම කියනවා.

ඇවිද ළදු දෙණි කැලෑ බිම්වල
රැගෙන විත් තුන්හිරිය පන් කොළ
යොදා කුකුළු සායම් රතු හා කොළ
කියා දුන් අම්මා ඔබය

අපිත් ජීවිතයේ සුන්දරත්වය විඳින්න මුලින්ම ඉගෙන ගත්තෙ අම්මගෙන්. ඒත් ඒ සුන්දරත්වය යටින් දිවෙන මහා කටුක දුක්ඛ දෝමනස්ස ප්‍රවාහය ඉගෙන ගත්තෙ ඔබෙන්. ජීවිතයේ සැබෑ අරුත වටහා ගන්නට අපිට අත්වැල වුණේ ඔබේ කවිය, ගීතය...

ගම ගැන වුණත් එහෙමයි.

අපේ බොහෝ කවියො කලාකරුවො, නිසංසල ගැමි සුන්දරත්වය වර්ණනා කරන කොට(අපේ සමහර චිත්‍රපටකාරයො, ටෙලිනාට්‍යකාරයො, ගීත රචකයො තාමත් ඒ සුන්දර ගමක් ගැන වර්ණනා කරනව) එහෙම ගමක් නැති බව අප දැක්ක. ඔබ තමයි අපි දැකපු ඒ ඇත්ත කවියට නගලා ඒ බව වටහා ගන්න අපට මග පෙන්නුවෙ.

ගම හීනෙන් දැක ගම ගැන අඬන්නේ
ගමට ගොහින් ගම හැබැහින් බල
හීනෙන් තොප දක්නා
චමත්කාරයක් එහි නැත
ඇය සංකර ගැහැනියක්ය
ගමටත් නගරයටත් දෙකටම නැති
(මක් නිසාද යත්)

අපි ගමෙන් නගරයට සංක්‍රමණය වෙලා ආවෙ කොහොමද කියලා හරියට ම ඔබ දැක්කා. ආපහු හැරිලා බලන කොට ඔබ ඒ බව කොයිතරම් පරිපූර්ණව ඒත් ඉතාම සරල විදිහට ප්‍රකාශ කරලා තියෙනවා ද කියලා හිතෙනවා.

සිදාදියට එන්නට මට
බුද්ධිය උඹ තමයි එදා
පාර කියා දුන්නේ
ගමෙන් උරුම වූ වස්තුව
පොදියක් බැඳ කර තියාන
උඹේ බහට රැවටීලයි සිදාදියට මං ආවේ
ඒ විදිහට නගරයට ආපු අපිට
අන්තිමට වුණේ මොකක්ද?
ඒ එන කොට ගෙන ආ දෙය
විය පැහැදම් කළා මිසක
මෙහිදී අලුතින් ඉපයූ කිසිම දෙයක් නැත්තේ
ඉස බර කළ පුහු නම්බුව විතරයි මට ඇත්තෙ

අද අපි ගමටත් නැති නගරයටත් නැති මුල් සිඳුණු පරපුරක්. සමහරු මේක දකින්නෙ මහා ඛේදවාචකයක් විදිහට. ඒ නිසා ඔවුන් යෝජනා කරනවා මේ සියල්ල හැර දමා අපි ආයෙත් අපේ ගමට අපේ අතීතයට යා යුතුයි කියලා. අපේ සමහර සාහිත්‍යකාරයො, දාර්ශනිකයො ඔය විදිහට යෝජනා කරනවා.

ඒත් ඒක කොහොමවත් වෙන්න බැරි දෙයක්. මොකද මේ ගමන ආපසු හරවන්න බෑ. ඔබ ඒ බව මීට බොහෝ කලකට පෙර දැක්කා. මේක වළක්වන්න බැරි සමාජ පරිණාමයේ කොටසක් බව ඔබ ලියා තිබුණා. ඉතින් ඒ සමාජ ප්‍රවාහය තුළ ඔබ එදා කී දෑ අත්දකිමින්, අත්විඳිමින් අපි ජීවත් වෙනවා.

අපට ඉහළින් ඉන්න සමාජ බලවේගයක් අපිව පාලනය කරනවා. ඔබ එදා දුටු ඒ පන්තිය අදත් ඒ වගේමයි. අද නගරයේ රාත්‍රියක සාදයකට ගියොත් ඔබ එදා කී ඒ පැළැන්තිය ඒ වගේම දැක ගන්න පුළුවන්.

සිටියෝ විසිත්ත කාමරයෙහි
කළු කබා මහත ටයි
ගරුතර මැති ඇමතිවරු
පිටිකර රැළි වැටුණු
කඳ බඩ හොඳින් ආරපු
සංස්ථා(සමාගම්) ලොක්කො සහ පෙරකදෝරුවො
පීරා ඇතින් කෙස් ගෙනත්
තට්ටය යන්තමින් වසා ගත්
රජයේ වර ලැබූ
ව්‍යාපාර හිමිකරුවෝ
ජාතික බැනියම අඳින
ඡන්දයට සල්ලි දෙන
(ප්‍රබුද්ධ)

ඒ පැලැන්තියේ සංස්කෘතිය එදා වගේමයි කිසිම වෙනසක් නැහැ. ප්‍රකෘති සමාජයෙන් ඇත් වූ ඒ සංස්කෘතිය අදත්



යෙහෙන් වැජඹෙනවා.

සිටියෝ මෝරපු ගෑනු
බැන්ද උස කෙණ්ඩා හා
ඝන දෙතොල් උල් නිය ඇති
අඩවන් තඩිස්සි ඇස්
ඉඟ දෙපසින් එල්ලෙන මස්
විජිනිපත් ගෙන පවන් සලමින්
බලමින් නෙත් කොනින් ගර්වයෙන්
මැකෙන රූ සිරියට මුක්කු ගසමින්
(ප්‍රබුද්ධ)

ඒ විතරක් නොවේ. යොවුන් පරපුරත් ඔබ කියූ විදිහමයි. කිසිම වෙනසක් නැහැ.

සිටියෝ ගැටවර ගැටවරියෝ
අවුල් දික් කෙස් වලු ඇති
පුම ඉතිරි ලිඟු වෙනස නැති
තඩි ඔරලෝසු අතෙහි ද
බැද තඩි පටි ඉණෙහි ද
ඇඳ නෙක සාක්කු ඇති හිර කලිසම
මිනි ගවුම් හා බෝල ගවුම්
යන එන මඟක නොම දැන
අතරං මංවූවන් මෙන්
(ප්‍රබුද්ධ)

මේ දෙවල් ඔබ කියූ ආකාරයට වඩා වෙනස් වෙලා නම් අලුත් තාක්ෂණය නිසා විතරයි. තාක්ෂණය අපේ ජීවිතය උඩු යටිකුරු කරලා. කොටින්ම තාක්ෂණය මල් පහන් පුදා වන්දනා මාන කරන තත්වයක් අද තියෙන්නෙ. යන එන මං නොදැන තාක්ෂණය හදාරමින් පමණක් නොවෙයි ඇඟ පුරා තවරා ගනිමින් අපි අද යන්නෙ නොනවතින ගමනක්.

ඔබට මතකද ඔබ කිව්වා ලෝකය එක යායක් වන දිනක් ගැන. එහෙම කතාවක් දැන් හැ මෝම වගේ කියනවා. ඒකට අපූරු නමක් දාල තියෙනවා. ගෝලීයකරණය කියලා. සමහරු ගෝලීයකරණයට ලෑස්ති වෙන්නෙ හරියට උදේට කරත්තෙට බඳින්න සූදානම් වෙලා ඉන්න ගොන්නු වගෙ. ගෝලීයකරණය හොඳ නරකක් නොදැන, නොවිමසා එයට සූදානම් වෙනවා. ඒකට ඔවුන් කියන හේතුව අපිට මේකෙන් ගැලවෙන්න බෑ කියන එක.

අදෘශ්‍යමාන වූ
කිසි බලවේගයක අත
උපකරණයක් විය ඔහු
අවිඥානක ඇඟිලි තුඩු
නිතැතින් ක්‍රියාකාරීව
අවිඥානය පතුලෙන්
සුසුම් සුවඳක් පෙරී ආවේය.
(ප්‍රබුද්ධ)

ගෝලීයකරණයේ ඒ සියුම් සුවඳ ඉව කරන ඔවුන් ඊට අනුගත වෙන්න උත්සාහ කරනවා මිසක්, ඊට ඔරොත්තු දෙන්න සූදානම් වෙන්නෙ නැහැ. ඒ ගැන හිතනවාට වඩා අද දවසේ කමින් බොමින් ජීවත් වීම පමණයි ඔවුන්ට අවශ්‍ය. ඔබ එදා කිව්වා වගේම.

හා ! එන්න!! ප්‍රීති වෙන්න ගී කියමින් පෙම්බරා
මේ වගේ තැනක් තවත් ලොවේ තියේ ද සුන්දරා?
හැම් බේකන් කන්න සල්ලි
බල්ලො මරාල හරි - සල්ලි හොයාලා
ඉන්න ටිකේ ඉම්මු සුදෝ - ජොලිය දමාලා
(ප්‍රබුද්ධ)

මේවට හේතු සාධක ඔවුන්ම හදා ගන්නවා. එහෙම නැත්නම් මහා පරිමාණ මුදලාලිලා හේතු හදා දෙනවා. එහෙම බැලුවම මේක එහෙම් පිටින්ම පාරිභෝගික සමාජයක් කියන එක ඇත්ත. ඒ වගේ මුදලාලිලා හදා දීපු උත්සවයක් මීට අවුරුදු කීපයකට කලින් දෙසැම්බර් 31 දා රෑ තිබුණා. ඒකට නම දාල තිබුණෙ සහස්‍රකයේ උදාව කියලා. ඇත්තෙන්ම උදා වුණේ නැති සහස්‍රකයක සමරමින් ශ්‍රී ලංකාවේ අගනුවරත් මිනිස්සු කාලා බීලා ගිනි තියලා සල්ලි වියදම් කළා. අඩුපාඩුවක් නැති වෙන්න මරණයක් දෙකකුත් සිද්ධ වුණා.

මේ දේවල් මෙහෙම සිද්ධ වෙද්දි රටේ එක පැත්තක තිබුණු යුද්ධය තාමත් හරිහැටි ඉවර වෙලා නෑ. තාමත් මිනිස්සු මැරෙනවා. ඒත් කාටවත් ගාණක් නෑ. අගනුවර දිහවෙ බෝම්බයක් පිපිරුණා ම බය වෙනවා. සෝදිසි මෙහෙයුම් කරනවා. ටික දවසකින් ඔක්කොම අමතක කරලා පරණ පුරුදු ජීවිතයට ම හැරෙනවා. ඔබ කිව්වා වගේම අද මුළු මහත් සමාජයම නම්බුකාර මළකුණක්.

කොතරම් මල්වඩම් ඇතත්
සුවඳ සඳුන් දිය ඉස්සත්
පලවා ලිය නොහැකිය
සුදු රෙද්දෙන් වැසී පෙනෙන
කුණු ඕජාව පෙරෙන දුර්ගන්ධය
මහන්තත්ත පාරට්ටුව

ඒත් මේ සියල්ල දෙස බලා ජීවිතය ගැන කලකිරී ජීවිතයෙන් පලා යන්න අපට බැහැ. ඔබ අපට කිව්වා මතකයි, මේ දේවල් මේ විදිහට යන බව. මිනිස් සබඳතා දෙදරා යන අයුරු ඔබ කිව්වෙ මෙහෙමයි.

සංක්‍රාන්ති කලියුගයේ
හෙල්ලුම් කන සමාජයේ
පාලම උඩ
මේ මගේ නෑයාය
මිතුරාය, සැමියාය, බිරින්දෑය
විශ්වාසයක් නොමැති
අන්තෝ ජටා බහි ජටා
(මක් නිසදා යත්)

ඒත් ඒ විෂම සමාජය තුළ පැරදී පලා යන්නට ඔබ අපට කිව්වෙ නෑ. ඔබ කිව්වෙ ඒ සියල්ල සන්සුන්ව වටහා ගන්නටයි.

විෂමව කැරකෙන ලොව දෙස
ඔබත් මමත්
ඈතට වී බලා සිටිමු
පබ්බතට්ඨොව භූමිමට්ඨෙ
මේ ලොව මීට වඩා යහපත් කොට
සාදන්නට
එවිට අපට හැකි වනු ඇත
(මක් නිසාද යත්)

එකිනෙකා කෙරෙහි ක්‍රෝධයෙන් යුතුව බලමින් ඔවුනොවුන් ඇනකොටා ගන්නා යුද්දෙකින් සමාජයකට යහපතක් විය හැකිද? සාමයක් උදා කළ හැකි වේද? ජාති, කුල, ආගම් යනාදී අනේක බෙදීම්වලින් හෙම්බත්ව සිටින අපට ඔබ එදා කී දේ මට වඩාත් අරුත් ගැන් වී ඉදිරිපත් වෙනවා. ඒත් ඒ අරුත වටහා ගන්නට මේ විෂම සමාජයේ ඉඩක් බවක් නොදැන ලෝක තරඟයක යෙදී සිටින අපේ මිනිසුන්ට පුළුවන් වේවිද?

ධර්මේ
කාසිම්
රාජසුන්දරම්
මෙහෙ වරෙල්ල
අපි ඔක්කොම එකතු වෙලා
මේ ලෝකය
යහපත් තැනක් කරමු මීට වැඩිය....

ඔබ මුළු මහත් මිනිස් වර්ගයා කෙරෙහි උපන් අප්‍රමාණ වූ දයාවෙන් යුතුව, ඔවුන්ගෙ ජීවිත අධ්‍යාත්මයන් හරහා ගමන් කරමින් වටහා දෙන්නට තැත් කළ ඒ පරම සත්‍ය අර්ථ සම්භාරය තවමත් අපට වටහා ගන්නට නොහැකි වූයේ මන්ද? ඔබ කී දේ වටහා ගන්නට ඔබ කී පරිදි ම ලෝකය මීට වඩා යහපත් වන දිනක් උදාවනතුරුම අපට බලා සිටින්නට වනු ඇත්ද?

එසේ වුව සොහොයුරනි
ඔබ ගැන ම මා ලියන ඒ කවිය
ඔබගෙන් බොහෝ දෙනෙකුට
අද දින නොවැටහෙන බව දනිමි
ලෝකය මීට වඩා යහපත් වන
අනාගතතේ යම් දවසක
ඔබ එය මීට වඩා ආදරයෙන්
කියවන බව ද දනිමි
(ප්‍රබුද්ධ)